චක්‍රලේඛ අංක - EP/PPSC/01/2015

ප්‍රධාන ලේකම්, ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
නැගෙනහිර පළාත.

**නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් තනතුරු වල සේවය කරන නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුව පිළියෙල කළ නැගෙනහිර පළාත් රාජ්‍ය සේවයට අයත් තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටි වල සඳහන් කොන්දේසි වලට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම සඳහා ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාවලිය සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

| අනු අංකය | මෙතෙක් ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව | නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව |
|---|---|---|
| 01 | පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සම්පූර්ණයෙන්ම අසමත් වී ඇති හෝ පළමුවන කාර්යක්ෂමතා පරීක්ෂණය සඳහා මෙතෙක් පෙනී නොසිටි නිලධාරීන් | තනතුරට අදාළ III/II ශ්‍රේණිය සඳහා වන සම්පූර්ණ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා පෙනී සිටිය යුතුය. |
| 02 | පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සම්පූර්ණයෙන්ම සමත් වී ඇති නිලධාරීන් | තනතුරට අදාළ III/II ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම. |
| 03 | විෂය නිර්දේශය, නව බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් විෂය නිර්දේශයට වෙනස්ව ඇත්නම්, පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් එක් විෂයයක් හෝ අසමත්ව ඇති නිලධාරීන් | තනතුරට අදාළ III/II ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ සියළුම විෂයයන්ට පෙනී සිටිය යුතුය. |
| 04 | විෂය නිර්දේශය හා නව බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් විෂය නිර්දේශය නොවෙනස්ව ඇත්නම්, පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් එක් විෂයයක් හෝ අසමත්ව ඇති නිලධාරීන් | තනතුරට අදාළ III/II ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ අසමත් වූ විෂය සඳහා පමණක් පෙනී සිටිය යුතුය. |
| 05 | දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සම්පූර්ණයෙන්ම සමත් වී ඇති නිලධාරීන් | තනතුරට අදාළ II/I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම. |
| 06 | දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සම්පූර්ණයෙන්ම හෝ එක් විෂයයක් හෝ අසමත් වී ඇති නිලධාරීන් සහ මෙතෙක් පෙනී නොසිටි නිලධාරීන් | තනතුරට අදාළ II/I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ තනතුරට අදාළ II/I ශ්‍රේණියට උසස් වීමෙන් පසුවය. |
| 07 | දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් නොවීම හේතුවෙන් වැටුප් වර්ධක අත්හිටුවා ඇති නිලධාරීන් | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ කාලපරිච්ඡේදය, නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දින දක්වා දීර්ඝ කරනු ලැබේ. |
| 08 | විෂය නිර්දේශය, නව බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් විෂය නිර්දේශයට වෙනස්ව ඇත්නම් සහ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් එක් විෂයයක් හෝ අසමත්ව ඇති නිලධාරීන් | තනතුරට අදාළ II/I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ සියළුම විෂයයන්ට පෙනී සිටිය යුතුය. |
| 09 | විෂය නිර්දේශය හා නව බඳවා ගැනීමේ පරිපාටියෙහි සඳහන් විෂය නිර්දේශය නොවෙනස්ව ඇත්නම්, දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් එක් විෂයයක් හෝ අසමත්ව ඇති නිලධාරීන් | තනතුරට අදාළ II/I ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ අසමත් වූ විෂය සඳහා පමණක් පෙනී සිටිය යුතුය. |
| 10 | ඇතැම් තනතුරු වලට පමණක් I ශ්‍රේණිය සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවතුනි. | බඳවා ගැනීමේ පරිපාටිය මඟින් හෝ රාජ්‍ය පරිපාලන/නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛයන් මඟින් නිදහස්වීම් ලබා දී නොමැති නම් නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර I ශ්‍රේණියට උසස් වීමෙන් පසු වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් වැටුප් වර්ධක පහ (05) උපයාගෙන ඇති නිලධරීන් නව බඳවා ගැනීමේ පරිපාටිය යටතේ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් විවර්ජනය (නිදහස්) කෙරේ.<br><br>නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පෙර I ශ්‍රේණියට උසස් වීමෙන් පසු වසර පහක |

| | | |
|---|---|---|
| | | (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ නොකළ, වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන නොමැති නිලධාරීන්ට, නව බඳවා ගැනීමේ පරිපාටිය යටතේ I ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම සඳහා නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනයේ සිට වසර පහක (05) සහන කාලයක් ලබාදෙනු ලැබේ. |

නැගෙනහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සහ ඔබ අමාත්‍යාංශය/කාර්යාලය මඟින් ඉදිරියේදී පවත්වනු ලබන සියළුම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා ඉහත සඳහන් අනුමත විධිවිධාන අදාළ කර ගන්නා ලෙස ඔබ අමාත්‍යාංශය/කාර්යාලය යටතේ පවතින සියළුම දෙපාර්තමේන්තු/ආයතන/කාර්යාල දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

එච්.ඊ.එම්.ඩබ්.ජී දිසානායක,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
නැගෙනහිර පළාත.